**ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය (සීඒආර්ර්) සී සංරචකය - 2013**

------------------------------------------------------------------------------------------------------------------

ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ව්‍යාපෘතියේ (සීඒආර්ර්) සී සංරචකයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2010 ජුනි 07 දින එළඹි අංක 2626 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ 11 ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රතිපත්ති සැලසුම්,ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, වෘත්තිය පුහුණු අධිකාරිය සඳහා තරුණ කටයුතු අමාත්‍යාංශය, උතුරු පළාත් සභාවේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ගැටුම්වල බලපෑමට ලක්වූ ප්‍රදේශවල ජීවනෝපාය, ආර්ථික යටිතල පහසුකම් සහ පරිපාලන හා නිති සේවා ප්‍රතිස්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම අනුව,ව්‍යාපෘතියේ ‘ සී ’ සංරචකය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 39.06 ක් වන අතර ඉන් එජඩො මිලියන 35.27 ක් හෙවත් සියයට 89 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 ජුනි 07 දින ආරම්භ කරන ලද අතර 2013 ජුනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.3 ව්‍යාපෘතියේ කාර්යයන්

----------------------------

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ‘ සී ’ සංරචකයට අදාළ කාර්යයන් පහත සාරාංශ කර දැක්වේ.

| | | |
|---|---|---|
| 6 කොටස | - | මධ්‍යම හා කුඩා වාරිමාර්ග යෝජනා ක්‍රම 10 ක් පමණ ප්‍රතිස්ථාපනය කිරීම. |
| 7 කොටස | - | පරිපාලන කාර්යාල 10 ක් යළි ගොඩනැගීම හා අදාළ පහසුකම් සැපයීම. |
| 8 කොටස | - | කිලිනොච්චි, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික් වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම. |

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම
මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කර තිබුණේද යන බව.

(උ) විශේෂ ඩොලර් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට කරන ලද ඌනපූරණයන් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ල ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

3. මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර, මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන
------------------

4.1 මූල්‍ය කාර්ය සාධනය
-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.2,246,480,822 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.4,491,658,831 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම සහ ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **වියදම් විෂයය** | **වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 2,158,139,415 | 1,414,076,206 | 4,243,059,904 |
| කාර්යාල උපකරණ | 106,654 | - | 650,454 |

| | | | |
|---|---|---|---|
| උපදේශක සේවා | 38,842,907 | 41,584,104 | 150,049,269 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 30,185,821 | 15,226,286 | 61,285,627 |
| බැඳීම් ගාස්තු | 19,206,025 | 12,687,390 | 36,613,577 |
| | ------------------ | ----------------- | ------------------- |
| | 2,246,480,822 | 1,483,573,986 | 4,491,658,831 |
| | =========== | =========== | =========== |

4.3 අග්‍රිම අරමුදල් ගිණුම

-------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | | එජඩො | රු. |
|---|---|---|---|
| | | ---------- | ------ |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | | 470,469 | 59,825,196 |
| එකතු කළා:- | ඌනපූර්ණයන් | 5,024,358 | 644,595,682 |
| | ප්‍රත්‍යාගණන වාසිය | - | 2,077,717 |
| | | ------------- | ---------------- |
| | | 5,494,827 | 706,498,595 |
| අඩුකළා :- | ආපසු ගැනීම් | 5,487,540 | 705,545,724 |
| | | ------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 7,287 | 952,871 |
| | | ======== | =========== |

5. විගණන නිරීක්ෂණ

---------------------

5.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් 06 දෙනෙකුට ගෙවන ලද එකතුව රු.98,180,975 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද රු.114,248 ක් වූ විදුලි වියදම් හා දුරකථන වියදම් ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම ලෙස සාවද්‍යාව අය කර තිබුණි.

(ඇ) ණය මුදල්වලින් කොන්ත්‍රාත්කරුවකු විසින් මිලදී ගන්නා ලද වටිනාකම රු.2,460,000 ක් වටිනා මැනීම් උපකරණ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට කොන්ත්‍රාත්තුවේ පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි.

5.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

---------------------------------------------------

2003 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව, එක් එක් කොන්ත්‍රාත්කරුට අදාළව වෙන වෙනම එකතු කළ අගය මත බදු ගෙවීම් පිළිබඳ තොරතුරු විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට මාසිකව ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතුව රු.70,291,633 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවීම් විස්තර

දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ට නියමිත කාලය තුළ දන්වා යවා නොමැති බව විගණන නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය.

5.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.
-----------------------------------

ජලාශ 44 ක් පුනරුත්ථාපනය කිරීමට අදාළව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද රු.38,842,907 ක් වූ අතුරු ගෙවීම් පිළිබඳ උපදේශකවරයාගේ භෞතික නිරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

6. මූල්‍ය හා කාර්යසාධන සමාලෝචනය
-------------------------------------------

6.1 අරමුදල් උපයෝජනය
---------------------------

ලැබුණු තොරතුරු අනුව, මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 35.27 | 3,985.51 | 548.30 | 14.67 | 1,907 | 26.29 | 3,417.95 |
| ශ්‍රී ලං ර | 3.79 | 428.27 | 207.00 | 1.73 | 225 | 3.82 | 496.26 |
| එකතුව | 39.06 | 4,413.78 | 755.30 | 16.40 | 2,132* | 30.11 | 3,914.21* |

* වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා සමඟ මෙම සංඛ්‍යා එකඟ නොවේ.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාලපරිච්ඡේදය තුළ ඉටු කර ගත යුතු ඉලක්ක සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.එබැවින් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීමට හා සකස් කරන ලද අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනස් කිරීම් සිදුකිරීම සඳහා ව්‍යාපෘතියේ ප්‍රගතිය සමස්තයක් ලෙස විධිමත්ව ඇගයීම් කළ නොහැකි විය.

(ආ) කිලිනොච්චි, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්කවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය සඳහා ව්‍යාපෘති ගිවිසුම අනුව සිදුකළ යුතු කාර්යයන් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කළ දිනයේ සිට වර්ෂ 03 ක් ගතවීමෙන් පසුවත් ආරම්භ කර නොතිබුණි.

6.2 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කළ අගය මත බදු කාර්යයන් සඳහා ලියාපදිංචි අංකවල වලංගුභාවය පරීක්ෂා කිරීමෙන් තොරව, ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද පුනරුත්ථාපන කාර්යයන් 05 ක් යටතේ එකතුව රු.2,457,468 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. අදාළ කොන්ත්‍රාත්කරුවන්ගේ එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකයන් ගෙවීම් කරන අවස්ථාවේදී වලංගු නොමැති අංකයන් බව විගණනයේදී අනාවරණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද පුනරුත්ථාපන වැඩ පිළිබඳව වැඩබිම්වල විගණන පරීක්ෂණයන් සිදුකරන ලද අතර ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුලතිව් දිස්ත්‍රික්කයේ කල් විලන් කුලම් ජලාශය පුනරුත්ථාපනය කිරීම යටතේ වේල්ලක් ඉදිකිරීම සඳහා සක්ක ගල් සැපයීම හා ප්‍රවාහනය කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.4,046,951 ක මුදලක් වැය කර තිබුණද, පවරා තිබූ වැඩ සම්පූර්ණ කර නොතිබුණි. තවද ජලාශයේ වේල්ල විධිමත් පරිදි තදකිරීම් සිදුනොකිරීම හේතුවෙන් ස්ථාන කිහිපයක් හානි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ii) තවද කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පුදුම්උරිප්පු ජලාශය පුනරුත්ථාපනය කිරීම යටතේ ටර්ෆ් වැඩ සඳහා රු.2,881,795 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් එම වැඩ ක්‍රියාත්මක කර නොතිබූ බව විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

(iii) මුලතිව්හි තන්නිමුරිප්පු හා කිලිනොච්චිහි පුදුම්උරිප්පු ජලාශ පුනරුත්ථාපනය කිරීම පිළිබඳ උපදේශක විසින් පෙන්වා දුන් දෝෂ නිශ්චිත කාල පරිච්ඡේදය තුළදී සාර්ථකව සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) පුනරුත්ථාපන වැඩ ආරම්භක අදියරයන්හිදී බිම් සමීක්ෂණ සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් නිරන්තර ලක්ෂණයක් ලෙස ඒ මත අතිරේක වැඩ සඳහා ගෙවීම් කර තිබුණි.එබැවින් ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද පුනරුත්ථාපන වැඩ 06 ක් යටතේ සියයට 14 සිට සියයට 44 දක්වා අතිරේක වැඩ අනුමත කර තිබුණි. තවද රු.90,965,990 ක පිරිවැයකට පුනරුත්ථාපන වැඩ 6 ක් යටතේ නිකුත් කරන ලද විචලන නියෝග සඳහා අනුමැතිය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවට නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබා දී තිබුණි.